# නුවරකලාවියේ හා පහතරට ලංකාවේ මල්වරවීම සම්බන්ධව ඇති අභිචාර විධි පිළිබඳ අධ්‍යයනයක්

පී.එච්.එම්.කේ.පී.පී.සී. සුබෝධනී ගමකුමාර[1], ඊ.ඒ.එන්. නිශ්ශංක[2], එන්.ආර්. අමරවීර[3]

ලොකු ළමයකු වීම, වැඩිවිය පැමිණීම, කොටහළු වීම, හැලිමඟුල් වීම ආදී විවිධ නම්වලින් මල්වරවීම හඳුන්වයි. නුවරකලාවිය හා පහතරට ප්‍රදේශවල මල්වරවීමේ අභිචාර අතර ඇති විෂමතා සංසන්දනාත්මකව අධ්‍යයනය මෙම පර්යේෂණයේ ගැටලු වේ. ඉහත ප්‍රදේශයන්හි මල්වරවීම සම්බන්ධයෙන් ඇති අභිචාර හඳුනාගැනීම සඳහා ක්ෂේත්‍ර හා ක්ෂේත්‍ර නොවන අධ්‍යයනයන් සිදුකිරීම මෙහි ක්‍රමවේදය වේ. නුවරකලාවිය හා පහතරට ප්‍රදේශ ආශ්‍රිතව දැරියක මල්වර වූ පසු පළමුව හුදකලා කරයි. පහතරට ප්‍රදේශයන්හි දැරියක මල්වර වූ පසු නිවසේ පසුභාගයේ රඳවා සමහරු අතට දැකැත්තක් දී, කිරි ගසකට කෙටීමට හැර කිරි දැකීමට සලස්වන අතර වැවර ගෙඩියක වතුර දීම විශේෂත්වයකි. ඉහත ප්‍රදේශ දෙකෙහිම දැරියට යකඩින් තැනූ යමක් දී කාන්තාවක නවතා වැඩිහිටියන් නැකැත් බැලීමට යති. නැකැත්රාළ මල්වර වූ වේලාව සුබ ද, අසුබ ද යන්න ප්‍රකාශ කරයි. හුදකලා කාලයේ තෙල්, පිළී ආහාර ගැනීම, පිරිමින් දැකීම, හඬනගා කතා කිරීම තහංචිය. රජක ස්ත්‍රිය දැරිය ඇඳ සිටි ඇඳුම් කිලි මුට්ටියට දමා ගොම්මන් වෙලාවේ කැලෑවට ගොස් දමන්නේ නැකතට ස්නානය කරන දිනයේදීය. නුවරකලාවියෙහි ජනයා කිලි මුට්ටියට දැරියගේ හිසකෙස් හා කෙළ බිඳක් දමයි. පහතරට ප්‍රදේශයෙහි මෙයට දැරිය විසින්ම රෙදිපිළි බහාලන්නේ පසුව සිදුවන ඔසප් වීම දින දෙකකට සීමා වීම බලාපොරොත්තුවෙනි. ප්‍රදේශ දෙකෙහිම දැරියව බෙහෙත් කළයකින් නෑවීම රජක ස්ත්‍රිය සිදු කරයි. මල්වර නැකත අසුබ නම් කඩුලු පැනීම නැමැති චාරිත්‍රය කරයි. සුබ නැකතින් කඩුලු පැනීමෙන් අපල දුරුවී නිවසින් පිටතට යාමට හැකිබව විශ්වාස කරති. පහතරට ප්‍රදේශයෙහි නැකතට අනුව ගෙට කැඳවීම සවස් කාලයේම සිදු කරයි. මව කිරිබත්, සුදු මල් බඳුනක්, දැල්වූ පහනක් රැගෙන ඇය ඉදිරියට පැමිණේ. මෙය ගෙට එන මඟුල ලෙස හැඳින්වීම විශේෂත්වයකි. ප්‍රදේශ දෙකෙහිම නැකතට දෙ වැනි නෑවීම මව හෝ නැන්දනිය විසින් සිදු කරයි. ඉන්පසු පිරිනැමූ ඇඳුම්, ආභරනවලින් සැරසෙන අතර තෙමසක් යනතුරුම තෙල්, පිළී සහිත කෑම තහංචිය. මෙම ප්‍රදේශ දෙකෙහිම රජක ස්ත්‍රියට යම් මුදලක්, එළවළු, තුනපහ, හාල්, පොල්, කැවිලි ආදී නොයෙක් ද්‍රව්‍යයන්ගෙන් සංග්‍රහ කරයි. අතීතයේ පැවතී ආවේණික විවාහ ක්‍රම නිසා එම ප්‍රදේශයන්හි පමණක් මෙම අභිචාර පැවතුණි. වර්තමාන සමාජ දියුණුවත් සමඟ ප්‍රදේශ අතර ඇති වූ විවාහයන් හේතුවෙන් අභිචාරයන්හි සංකලනයක් සිදු වී වර්තමානයේ සාම්‍යතාවයක් ද දක්නට ලැබේ. අද ගෝලීයකරණය සිදුවූවත් කාන්තාවන්ගේ යහපැවැත්ම, නිරෝගිකම, ආරක්ෂාව උදෙසා ලාංකීය සමාජය මෙම අභිචාර විධි පිළිගන්නා අතරම ඉදිරියට පවත්වාගෙන යනු ලැබේ.

**ප්‍රමුඛ පද :** අභිචාර, නුවරකලාවිය, පහතරට, මල්වර වීම, විෂමතා

[1 3] භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. chanuherath110@gmail.com

[2] සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. nimashanishshanka@gmail.com